සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ.
- I කොටසට ඇතුළත් බහුවරණ ප්‍රශ්න 30 සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- II කොටස හා I කොටස පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

(01) භූ ලක්ෂණ සිතියමක 1 : 50,000 යන්නෙන් අදහස් වනුයේ මින් කුමක් ද?

(1) භූමියේ සෙ.මී. 50,000 ක් සිතියමේ සෙ.මී. 2 ක් තුළ දැක්වෙන බවය.


(2) භූමියේ සෙ.මී. 50,000 ක් සිතියමේ සෙ.මී. 1 කින් දැක්වෙන බවය.


(3) භූමියේ සෙ.මී. 50,000 ක් සිතියමේ කි.මී. 1 කින් දැක්වෙන බවය.

(4) භූමියේ කිලෝමීටර 1/2 ක් පැතලි තලයක සෙ.මී. 1 කින් දක්වන සිතියමකි. (......)

(02) ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම්වල භාවිතා වන පහත සඳහන් සංකේත පිළිවෙලින් දැක්වෙන පිළිතුර මින් කුමක් ද?


(a)


(b)



(c)

The National e-learning Portal for The General Education


(1) ජනාවාස, පාලම, අඩිපාර. (2) අඩිපාර, පාලම, ක්‍රිස්තියානි පල්ලිය.

(3) අඩිපාර, බෝක්කුව, ජනාවාස. (4) දුම්රිය පාර, බෝක්කුව, මුස්ලිම් පල්ලිය. (......)

(03) රූපයේ දැක්වෙන්නේ භූ ලක්ෂණ සිතියමක සමෝච්ච රේඛා සහිත සටහන් දෙකකි. එහි A රූපය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශයද, B රූපය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය ද පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න.



A



B

(1) A රූපයේ කපොල්ලක් ඇත. B රූපයේ සානුවක් ඇත.

(2) A රූපයේ කඳු වැටියක් ඇත. B රූපයේ ගංගා කපොල්ලක් පවතී.

(3) A රූපයේ අවම සමෝච්ඡ රේඛාව මීටර් 180 වන අතර B රූපයේ ආයතගාමී නිම්නයක් ඇත.


(4) A රූපයේ කොත් කන්දක් ඇත. B රූපයේ මීටර් 200 ට අඩු උස නිම්නයක් පවතී. (......)

(04) වර්ග කිලෝමීටර් 30 ක භූමි ප්‍රදේශයක් 1 : 50,000 මෙට්‍රික් සිතියමක පෙන්වන්නේ පහත සඳහන් කවර ආකාරයෙන් ද?

(1) දිග සෙ.මී. 6 ක් හා පළල සෙ.මී. 5 කිනි. (2) දිග සෙ.මී. 6 ක් හා පළල සෙ.මී. 6 කිනි.

(3) දිග සෙ.මී. 12 ක් හා පළල සෙ.මී. 10 කිනි. (4) දිග සෙ.මී. 12 ක් හා පළල සෙ.මී. 12 කිනි. (......)

(05)




භූ ලක්ෂණ සිතියම උතුර දක්වෙන ආකාරය මෙහි ඇත. එහි ජාල උතුර පෙන්වන්නේ කුමන අක්ෂරයෙන් ද?

(1) A

(2) B

(3) C

(4) D (......)

(06) පහත සඳහන් සිතියම් වර්ග අතරින් භෞතික තොරතුරු පමණක් අඩංගු වන තේමා සිතියම් සහිත පිළිතුර තෝරන්න.

(1) භූමි පරිභෝග සිතියම්, දේශගුණ සිතියම්, පාංශු සිතියම්.

(2) ජන ඝනත්ව සිතියම්, දේශගුණ සිතියම්, පාංශු සිතියම්.

(3) භූ විද්‍යා සිතියම්, ජල විද්‍යාත්මක සිතියම්, පාංශු සිතියම්.

(4) කලාප සිතියම්, ජනාවාස සිතියම්, වෘක්ෂලතා සිතියම්. (......)

(07) ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක දත්තද දක්විය හැකි සිතියම් වර්ගය මින් කවරක් දැයි තෝරන්න.

(1) භූ ලක්ෂණ සිතියම් (2) තේමා සිතියම් (3) ගුවන් සිතියම් (4) ද්වි මාන සිතියම් (......)

(08) නවීන සිතියම් විද්‍යාව යන්නට ඇතුළත් කළ නොහැකි ප්‍රකාශය සහිත පිළිතුර තෝරන්න.

(1) අංකිත හා ගතික මාධ්‍යයන් තුළින් දත්ත පෙන්වයි.

(2) විවිධ මෘදුකාංග තුළින් දත්ත ග්‍රහණය කරයි.

(3) සිතියමක නිවැරදි පිහිටීම ආරක්ෂා කරයි.

(4) නිර්මාණය, සංස්ලේෂණ හා දත්ත විශ්ලේෂණය සඳහා විශාල කාලයක් ගත වේ. (......)

(09) දුරස්ථ සංවේදන තාක්ෂණය මඟින් භූගෝලීය දත්ත සෘජුවම සිතියම් නිර්මාණය සඳහා යොදා ගන්නේ මින් කවර ආකාරයට ද?

(1) ක්ෂේත්‍රීය දත්ත සෘජුවම ලබා ගැනීමෙනි.

(2) නවතම දත්ත ඇතුළත් කිරීමෙනි.

(3) දත්ත මූලාශ්‍ර බණ්ඩාංක පද්ධති ගත කිරීමෙනි.

(4) යාවත්කාලීනව දත්ත එකතු කිරීමෙනි. (......)

(10) දෛශික සිතියම් සඳහා අයත් වන්නේ මින් කවර සිතියම් වර්ග ද?

(1) GSP තාක්ෂණය මඟින් ඇඳෙන සිතියම්. (2) ගුවන් ඡායාරූප මඟින් ලබා ගන්නා සිතියම්.

(11) 2200km පමණ ඝනකමින් යුතු පෘථිවි ශිලා ගෝලයේ පවතින ස්ථරය මින් කුමක් ද?

(1) කබොල්ල (2) ප්‍රාවරණය (3) බාහිර හරය (4) අභ්‍යන්තර හරය (......)

(12) ලෝකයේ පවතින බියෝම සියල්ලම එකතුවීමෙන් සෑදෙන්නේ,

(1) ජෛව ගෝලයයි. (2) පරිසර පද්ධතියයි. (3) ජෛව ප්‍රජාවයි. (4) අභ්‍යන්තර හරයයි. (......)

(13) මැග්මා $\rightarrow$ A $\rightarrow$ ආග්නේය පාෂාණ $\rightarrow$ B $\rightarrow$ අවසාදිත පාෂාණ,

මෙම චක්‍රයෙහි A හා B ක්‍රියාවලීන් පිළිවෙලින් දැක්වූ විට,

(1) උණුවීම, නිධි සාදනය. (2) ජීර්ණය, නිධි සාදනය.

(3) ස්ඵටිකීකරණය, ජීර්ණය. (4) ස්ඵටිකීකරණය, උණුවීම. (......)

(14) සාරවත් පාංශු මහලක් නිර්මාණය සඳහා වඩාත් දායක වන ප්‍රකාශය තෝරන්න.

(1) ජෛන්ද්‍රීය පද්ධති බහුල පරිසර පැවතීම.

(2) තෙත් දේශගුණික ලක්ෂණ සහිත ප්‍රදේශ පැවතීම.

(3) ප්‍රදේශයේ බෑවුම සමතලා බවින් යුතු වීම.

(4) නිධි සාධනය අධික ප්‍රදේශයක් වීම. (......)

(15) ශාක මුල් මඟින් අවශෝෂණය කර ගන්නේ මින් කවර ආකාරයට පවතින ජලය ද?

(1) ජලාකර්ණ ජලය (2) කේෂාකර්ෂණ ජලය

(3) ගුරුත්වාකර්ෂණ ජලය (4) භූගත ජලය (......)

(16) භූ රූපික ක්‍රියාවලියේ දී බහිර් ජන්‍යය ක්‍රියාවලි මඟින් සිදුවන දෑ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.


(1) ග්ලැසියර්, භූගත ජලය, යමහල් කරණය.

(2) ග්ලැසියර්, ගලන ජලය, භූ විරූපණය.

(3) අවක්‍රමණය, ස්කන්ධ හායනය, ගලන ජලය.

(4) භූ විරූපණය, යමහල් කරණය, විභේද. (......)

(17) පහත දැක්වෙන්නේ යමහල් භූ රූපයක ස්වභාවය දක්වන සටහනකි. එයට අදාළ වන නිවැරදි පිළිතුර තෝරන්න.



(1) සිලිකා වැඩිය. යකඩ ප්‍රමාණය අඩුය. (2) සිලිකා අඩුය. යකඩ ප්‍රමාණය වැඩිය.

(3) සිලිකා හා යකඩ සමානව ඇත. (4) යකඩ පමණක් බහුලව ඇත. (......)


The National e-learning Portal for the General Education

(18) ගංගාවක යෞවන, පරිණත හා වෘද්ධ අවධිවල දැකිය හැකි භූරූප පිළිවෙලින් දක්නට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) දිය ඇලි, ගල්වන, නෙත්තිනෙරු. (2) පිටාර තැන්න, දුනුවිල්, දිය ඇලි.

(3) ගල්වන, නෙත්තිනෙරු, පුළුල් නිම්න. (4) ගල්වන, ගං දඟර, දුනුවිල්. (......)

(19) මෙහි දැක්වෙන ග්ලැසියර් භූ රූපයෙහි A, B හා C වලින් දැක්වෙන ස්ථානවල පවතින භූමි ලක්ෂණ දක්වන්න.




(1) ප්‍රධාන ග්ලැසියර් නිම්නය, අතුරු ග්ලැසියර් නිම්නය, දිය ඇලි.

(2) ප්‍රධාන ග්ලැසියර් නිම්නය, දිය ඇලි, අතුරු ග්ලැසියර් නිම්නය.

(3) අතුරු ග්ලැසියර් නිම්නය. ප්‍රධාන ග්ලැසියර් නිම්නය, දිය ඇලි.

(4) පුළුල් U හැඩ නිම්නය, දිය ඇලි, ලම්භ නිම්න වේ. (......)

(20) භූ තලය ආශ්‍රිතව දූවිලි හා වෙනත් දූෂක අංශු ආශ්‍රිතව ජලවාෂ්ප඼ ඝනීකරණය වීමෙන් නිර්මාණය වන්නේ,

(1) මීදුම වේ. (2) පටලය වේ. (3) තුහින වේ. (4) ධූමිකා වේ. (......)

(21) ක්‍රි.ව. 1850 වසරේ දී ලෝක ජන සංඛ්‍යාව ආශ්‍රිතව සිදුවූ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ මින් කවරක් ද?

(1) ලෝක ජන සංඛ්‍යාව මිලියන 1000 ක් වීම.

(2) ලෝක ජන සංඛ්‍යාව මිලියන 2000 ක් වීම.

(3) උපත් ප්‍රමාණය 200% කින් ඉහළ යාම.

(4) ආසියාවේ ජන සංඛ්‍යා ප්‍රමාණය වසර 200 කින් දෙගුණ වීම. (......)

(22) ජන හීන ප්‍රදේශ සහිත කාණ්ඩය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

(1) ගෝබි කාන්තාරය, මධ්‍යම ආසියාව, බ්‍රසීලය.

(2) ආර්ජන්ටිනාව, තාර් ප්‍රදේශය, ග්‍රීන්ලන්තය.

(3) උතුරු ඉන්දියාව, රොකී ප්‍රදේශය, කැලිපෝර්නියාව.

(4) මධ්‍යම ආසියාව, උතුරු රුසියාව, මධ්‍යම බ්‍රසිලය. (......)

(23) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව වැඩිම ජන සංඛ්‍යා වර්ධන වේගයක් පවතින දිස්ත්‍රික්කය වන්නේ මේවායින් කවරක් ද?

(1) බදුල්ල, මාතර, නුවරඑළිය වේ. (2) මුලතිව්, වව්නියා, අම්පාර වේ.

(3) යාපනය, නුවරඑළිය, කෑගල්ල වේ. (4) ගාල්ල, මහනුවර, මාතලේ වේ. (......)

(24) සේවා නියුක්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) වාර්ෂික කෘෂිකර්මයේ නියැලෙන ප්‍රමාණය අඩුවී තිබේ.

(2) මුළු ජන සංඛ්‍යාවෙන් 73% ක් කෘෂි අංශයේ නියැලී ඇත.

(3) කෘෂිකර්මය ආශ්‍රිත සේවා අංශයේ ප්‍රමාණය වැඩි වී තිබේ.

(4) රාජ්‍ය අංශයෙන් කෘෂිකර්ම කෙරෙහි වැය කරන මුදල ක්‍රමයෙන් වැඩිවී තිබේ. (......)

(25) $\dfrac{70}{\text{ජනගහන වර්ධන වේගය}}$

ඉහත සූත්‍රය ඇසුරින් ගණනය කරනු ලබන්නේ රටක කුමක් පිළිබඳ දත්ත වේද?

(1) දළ උපත් අනුපාතිකය. (2) දළ මරණ අනුපාතිකය.

(3) ජනගහන වර්ධන වේගය. (4) ජනගහනය දෙගුණ වීමට ගතවන කාලය. (......)

(26) ජාත්‍යන්තර සංක්‍රමණ නිසා ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන ජනගහන වර්ධන ප්‍රමාණයේ වෙනසක් ඇති වූයේ මින් කවර වකවානුවේ ද?

(1) 1979 2001 (2) 1971 1981 (3) 1871 1881 (4) 1970 1980 (......)

(27) ලෝක ජන සංඛ්‍යාව ආශ්‍රිත භාෂාවන් භාවිතයේ දී වැඩිම ජන කොටසක් කථා කරන භාෂා පිළිවෙලින් අවරෝහණ ක්‍රමයට දක්වූ විට අදාළ වන පිළිතුර කුමක් ද?

(1) මැන්ඩරීන්, හින්දි, රුසියානු, ඉංග්‍රීසි භාෂා වේ.

(2) මැන්ඩරීන්, ඉංග්‍රීසි, හින්දි, ස්පාඤ්ඤ භාෂා වේ.

(3) ඉංග්‍රීසි, හින්දි, අරාබි, ජපන් භාෂා වේ.

(4) ඉංග්‍රීසි, මැන්ඩරීන්, ප්‍රංශ, ජපන් භාෂා වේ. (......)

(28) ලෝකයේ නගර වර්ධනය ශීඝ්‍රයෙන් වර්ධනය වීම ආරම්භ වූයේ මින් කවර කාලයකද?

(1) 15 වන සියවසෙන් පසුවය. (2) 16 වන සියවසෙන් පසුවය.

(3) 17 වන සියවසෙන් පසුවය. (4) 18 වන සියවසෙන් පසුවය. (......)

(29) ද්විතීයික හා තෘතීයික ආර්ථික කටයුතු බහුල වන ජනාවාස වර්ගය මින් කුමක් ද?

(1) ග්‍රාමීය ජනාවාස (2) නාගරික ජනාවාස

(3) විස්තීර්ණ ජනාවාස (4) සැලසුම්ගත ජනාවාස (......)

(30) ජන සංඛ්‍යාව, නාගරික ලක්ෂණ හා කෘෂිකාර්මික නොවන රැකියාවන්ගේ ප්‍රතිශතය අනුව නාගරික ජනාවාස වෙන් කරනු ලබන්නේ මින් කුමන රටවල් ද?

(1) රුසියාව, ලිතුවේනියාව. (2) චීනය, ලිබියාව.

(2 x 30 = 60)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න එකකට පිළිතුරු සපයන්න.

(01) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ 1 : 50,000 භූ ලක්ෂණ සිතියමකින් කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) අංක 1 චතුරස්‍රයේ පවතින භෞතික ලක්ෂණ 2 ක් ද, අංක 2 චතුරස්‍රයේ පවතින සංස්කෘතික ලක්ෂණ 2 ක් ද දක්වන්න. (ල.04)

(2) ප්‍රධාන ගංගාව ආශ්‍රිත සුවිශේෂී භෞතික ලක්ෂණ දක්වා ඒවා බිහිවීමට හේතු 2 ක් ලියන්න.(ල.04)

(3) AB හා CD වලින් දැක්වෙන බෑවුම් වර්ග දක්වන්න. (ල.02)

(4) සමස්ත සිතියම් ප්‍රදේශයේ භූ විෂමතාවය හා ජල වහනය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ කරුණු තුනක් කටු සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

(5) භූමි පරිභෝගය ආශ්‍රිත කටයුතු භූ විෂමතා ලක්ෂණ සමග කෙසේ සම්බන්ධ වී පවතින්නේ දැයි කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.04)

(02) (1) 1 : 50,000 භූ ලක්‍ෂණ සිතියම් හැරුණු විට භාවිතාවන වෙනත් සිතියම් වර්ග 02 ක් දක්වන්න. (ල.02)

(2) ලෝකයේ භාවිතාවන විවිධ සිතියම් විවිධ අවස්ථාවලදී මිනිසාට අවශ්‍ය වේ. ඔබ ඉහත දැක්වූ සිතියම් දෙවර්ගය ප්‍රයෝජනවත් වන අවස්ථා 02 ක් දක්වන්න. (ල.02)

(3) සිතියම් නිර්මාණ සඳහා GIS තාක්‍ෂණය භාවිතා කිරීමේ වාසි 04 ක් පැහැදිලි කරන්න. (ල.08)

(4) පරිගණක ඇසුරින් දත්ත නිර්මාණයේ දී භාවිතා වන දත්ත මූලාශ්‍ර 03 ක් දක්වා ඉන් එකක් මඟින් තොරතුරු ලබා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල.08)

(03) පහත දැක්වෙන දෑ වලින් හතරක් පිළිබඳව තොරතුරු පැහැදිලි කරන්න.

(1) ගුවන් ඡායාරූප.

(2) භූගෝලීය තොරතුරු පද්ධති.

(3) තේමා සිතියම්.

(4) මෙට්‍රික් සිතියමක පර්යන්ත තොරතුරු.

(5) නවීන සිතියම් විද්‍යාව. (ල. 5×4=20)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

(01) (1) පාරිසරික පද්ධතියක අඩංගු ජීවී සංරචක තුනක් හා අජීවී සංරචක තුනක් බැගින් නම් කරන්න. (ල.03)

(2) ජීවී පරිසර සංරචක අතර වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

(3) ජීවියාගේ සිට බියෝමයක් දක්වා ජෛව ගෝලයේ සිදුවන වර්ධනය උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ල.06)


(4) පෘථිවියේ ප්‍රධාන උපපද්ධතීන් සමඟ ජෛවගෝලය බැඳී පවතින ආකාරය වෙන වෙනම පහදන්න. (ල.05)

(02) (1) පාෂාණ මගින් පාංශු නිර්මාණය වීමේ ක්‍රියාවලිය දක්වන්න. (ල.03)

(2) පාංශු නිර්මාණය කෙරෙහි දායක වන සාධක කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(3) රූප සටහනෙන් O, A, B හා C වශයෙන් සඳහන් පාංශු ස්තර විස්තර කරන්න. (ල.06)

(4) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දක්නට ලැබෙන රතු දුඹුරු පස ආශ්‍රිත ලක්ෂණ දක්වමින් ඒවාහි මානුෂ කටයුතු පහදන්න. (ල.06)




පාංශු ස්තර

(03) (1) ශුෂ්ක ප්‍රදේශවල භූ රූප නිර්මාණය කරන ක්‍රියාවලි තුන දක්වන්න. (ල.03)

(2) සොයිගම, වාකැට, ඉන්සෙල්බර්ග්, බාකන්ස් යන භූ රූප ඉහත දැක්වෙන ඒවායින් කුමන ක්‍රියාවලි ආශ්‍රිත භූ රූප දැයි දක්වා ඒවාහි නිර්මාණය කටු සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.08)

(3) දේශගුණය මුල් කරගෙන බිහිවී තිබෙන කාන්තාර වර්ග පිළිබඳව උදාහරණ දෙමින් විස්තර කරන්න. (ල.04)

(4) ජලය මගින් කාන්තාර භූ දර්ශන වෙනස් වීමට දායකවන භූ රූප 03 ක් පැහැදිලි කරන්න. (ල.05)

(04) (1) ලෝකයේ වර්ෂණය සිදුවන ක්‍රම 02 ක් හඳුන්වන්න. (ල.03)

(2) දේශගුණය පාලනය කරන සාධක 02 ක් පහත දක්වා ඇත. එම සාධක රටවල දේශගුණය වෙනස් කිරීමට බලපාන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

- සූර්ය විකිරණ තීව්‍රතාවය
- සාගර හා ගොඩබිම් ව්‍යාප්තිය (ල.06)

(3) වායුගෝලීය ද්විතීයික සංසරණ ක්‍රියාවලියක් ලෙස සැලකෙන වාසුළි රටක දේශගුණික තත්වයට බලපෑම් කරන ආකාරය පහදන්න. (ල.04)

(4) ඕස්ට්‍රේලියානු මහාද්වීපයට අයත්වන දේශගුණික වර්ග වලට අදාළ වන මායිම් පහත සිතියමේ දක්වේ. ඒවා නිවැරදිව හඳුනාගෙන එහි සංකේතය හා දේශගුණ වර්ගය දක්වන්න. ඉන් ඕනෑම එක් දේශගුණික වර්ගයක් තෝරාගෙන එහි කැපී පෙනෙන ලක්ෂණ සඳහන් කරන්න. (ල.07)




## II කොටස මානුෂ භූගෝල විද්‍යාව

(05) (1) ලෝක ජන සංඛ්‍යා වර්ධනය ආශ්‍රිත කැපී පෙනෙන අවධි දෙක නම් කරන්න. (ල.02)

(2) ඔබ ඉහත දක්වූ එක් අවධියක වර්ධනය වූ ශීඝ්‍ර ජන සංඛ්‍යා වර්ධනය ලෝකයේ රටවලට විශාල ගැටළු සංඛ්‍යාවක් ඇතිකළ බැව් උදාහරණ දෙමින් පහදන්න. (ල.06)

(3) ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාපෘතියට බලපාන සාධක 03 ක් පහදන්න. (ල.06)

(4) ආසියානු රටවල තරුණ හා වයස්ගත ජන සංඛ්‍යා කණ්ඩායම් ආශ්‍රිත ලක්ෂණ 03 ක් පහදන්න. (ල.06)

(06) ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක කීපයක ජන සංඛ්‍යාව පහත දක්වේ.

| දිස්ත්‍රික්කය | ජන සංඛ්‍යා ප්‍රමාණ දහස් ගණනින් |
|---|---|
| කොළඹ | 19886 |
| ගම්පහ | 2421 |
| මහනුවර | 1361 |
| මාතර | 804 |
| මඩකලපුව | 556 |
| අනුරාධපුරය | 791 |
| මොණරාගල | 420 |
| වව්නියාව | 100 |
| මුලතිව් | 164 |

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

(1) කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල වැඩි ජන සංඛ්‍යාවක් පැවතීමට හේතු 03 ක් පහදන්න. (ල.03)

(2) වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවල අඩු ජන සංඛ්‍යාවක් පැවතීමට හේතු 03 ක් පහදන්න. (ල.03)

(3) ඉහත වගුවේ දැක්වෙන තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය නිසා ඇතිවී තිබෙන ගැටළු 03 ක් පහදන්න. (ල.06)

(4) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතා 04 ක් උදාහරණ දෙමින් පහදන්න. (ල.08)

(07) (1) රටක ජනගහන වර්ධන අනුපාතිකය ගණනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ල.03)

(2) රටක ජන සංඛ්‍යාවේ ගතිකත්වය පිරමීඩ මගින් පෙන්වීමට හැකිවේ. එවැනි ජනගහන පිරමීඩ වර්ග රූප සටහන් මගින් දක්වන්න. (ල.04)

(3) පාකිස්ථානය හා නෝර්වේ යන රටවල් අයත්වන ඉහත ජනගහන පිරමීඩ නම් කර එම පිරමීඩ ආශ්‍රිත ලක්ෂණ ඇති රටවල ස්වභාවය පහදන්න. (ල.06)

(4) ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රමාණය වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධක දෙක විස්තර කරමින් ඒවා අනුව වර්තමාන රටවල ඇතිවී තිබෙන ගැටළු පහදන්න. (ල.07)

(08) (1) ජනාවාසයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල.03)

(2) ග්‍රාමීය හා නාගරික ජනාවාසවල පහත සඳහන් ලක්ෂණ කෙසේ පවතින්නේදැයි පහදන්න.

- ආර්ථිකය
- ජන සංඛ්‍යාව
- භූමි පරිභෝග රටාව
- සේවා සැපයීම (ල.08)

(3) නගර වර්ධනයේ විවිධ අවස්ථා 04 හඳුන්වන්න. (ල.04)

(4) ඔබ දැක්වූ එක් නගර වර්ගයක ස්වභාවය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.05)

The National e-learning Portal for The General Education